Department of Education, Sabaragamuwa Province/ Weekly School

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

Subject : JAPANESE LANGUAGE

Week: 10

Grade: 12

Prepared by: W.A.L.B.BANDARA
KG/Dharmasiri Senanayaka Central College

# カタカナ テスト

- **පහත වචන කතකනා අක්ෂර භාවිතයෙන් ලියා දක්වන්න.**

nekutai , tesuto, kōhi, sukāto, aisu, hōmu, tomato, potato, hankachi, raion, resutoran, sakkā, kuriketto, karaoke, toire, kurasu, suriranka, amerika, ōsutoraria, afurika, intānetto, kēki, pasokon, Pen, beddo, baiorin, piano, basu, painappuru, dansu, depāto, surippa, bisuketto, poketto, handobaggu, posutā, pēji, baiku, banana, rajio, terebi, indo, doitsu, beruto, gurasu, barēbōru, basukettobōru, beru, supōtsu, koronbo, Kyabetsu, shatsu, kabocha, kyandi, firipin

## UNIT 4 – 1 ［みかんを３つください］

### 言葉 - WORDS

いくつ - කිහිපයක්

それから - ඉන් පසු

エッグバン - බිත්තර බනිස්

コーヒー - කෝපි

ジュース - ජූස්

T シャツ - අත් කොට කමිසය

ネクタイ - ටයි පටිය

ハンカチ - ලේන්සුව

バナナ - කෙසෙල්

買(か)います - මිලදී ගන්නවා

ばらのはな - රෝස මල

かさ - කුඩය

切手(きって) - මුද්දර

くつ - සපත්තු

くつした - මේස්

じどうしゃ - වාහනය

ふうとう - ලියුම් කවරය

# <u>පසු යෙදුම්</u>

ජපන් භාෂාවේ විවිධ වස්තූන් ගණන් කිරීමේදී ඒ ඒ වස්තුව පෙන්නුම් කිරීම සදහා මූලික ගණන් කිරීමට එකතු කරනු ලබන පසු යෙදුම් ඇත.

- にん - මිනිසුන් ගණන් කිරීමේදී භාවිතා කරයි.
- まい - තුනී ස්වභාවයෙන් යුත් වස්තූන් ගණන් කිරීමේදී භාවිතා කරයි.
- だい - යන්ත්‍ර සූත්‍ර, වාහන ආදිය ගණන් කිරීමේදී භාවිතා කරයි.
- さつ - පොත්, සටහන් පොත් වැනි දේ ගණන් කිරීමේදී භාවිතා කරයි.
- ほん - සිහින්, දිගටි සිලින්ඩරාකාර හැඩයෙන් යුත් දේවල් ගණන් කිරීමේදී භාවිතා කරයි.
- そく - සපත්තු,මේස් ආදිය ගණන් කිරීමේදී භාවිතා කරයි.
- ひき - කුඩා සතුන්,මාළුන්,කෘමි සතුන් ගණන් කිරීමේදී භාවිතා කරයි.
- わ - කුරුල්ලන් ගණන් කිරීමේදී භාවිතා කරයි.
- はい - දියර පිරුණු භාජන හෝ වීදුරු ගණන් කිරීමේදී භාවිතා කරයි.

- こ - කුඩා ද්‍රව්‍ය ගණන් කිරීමේදී භාවිතා කරයි.

- とう - විශාල සතුන් ගණන් කිරීමේදී භාවිතා කරයි.

- さい - වයස ගණන් කිරීමේදී භාවිතා කරයි.

## N を / が （ N + じょすうし） V ます

- ほん が ごさつ あります。
  පොත් 5ක් තිබේ.

- ハンカチ を さんまい 買います。
  ලේන්සු 3ක් මිලදී ගන්නවා.

- あそこ に 学生 が 五人 います。
  අතන සිසුන් 5ක් ඉන්නවා.

## N を ください

- みかん を ください。

  දොඩම් දෙන්න.

- かさ を さんぼん ください。
  කුඩ 3ක් දෙන්න.

- きって を にまい ください。

මුද්දර 2ක් දෙන්න.

- **4 – 1 පාඩමේ Practice A , B , C ,D කරන්න.**

## UNIT 4 – 2 [あれも、これも ]

言葉 - WORDS

おもちゃ - සෙල්ලම් බඩු

なります - බවට පත් වෙනවා

ほしい - අවශ්‍යයි

カタログ - නාමාවලිය

クラシック - සම්භාව්‍ය

パソコン - පරිඝනකය

ラジオ - රේඩියෝව

うたいます - ගායනා කරනවා

お金 - මුදල්

おどります - නටනවා

およぎます - පිහිනනවා

ききます - සවන් දෙනවා

てにいれます -ලබා ගන්නවා

夏休み - ගිම්හාන නිවාඩුව

もちます - රැගෙන යනවා

もとめます - ඉල්ලා සිටිනවා

旅行します - සංචාරය කරනවා

あい - ආදරය

大人 - වැඩිහිටියන්

子供 - ළමුන්

今度 - මෙවර

こんばん - අද සවස

将来 - අනාගතය

誕生日 - උපන් දිනය

にんげん - මානවයා

ひとびと - මිනිසුන්

もの - දේවල්

## **N が ほしい です**

තමාට යම්කිසි දෙයක් අවශ්‍ය බව ප්‍රකාශ කිරීමේදී が නිපාතය සමග ほしい です භාවිතා කරනු ලබයි.

- わたし は とけい が ほしい です。

මට ඔරලෝසුවක් අවශ්‍ය වේ.

- わたし は カメラ が ほしい です。

  මට කැමරාවක් අවශ්‍ය වේ.

## N１ はN２を ほしがっています

වෙනත් අයෙකුට යම් කිසි දෙයක් අවශ්‍ය බව දැක්වීම සඳහා を නිපාතය සමග ほしがっています යොදනු ලැබේ.

- 弟 は くるま を **ほしがって います**。
  මල්ලීට වාහනයක් අවශ්‍ය වේ.

- 妹 は にんぎょう を **ほしがって います**。
  නංගීට බෝනික්කෙක් අවශ්‍යව සිටියි.

## N1 は N2 をほしがります

පොදු පුද්ගල කණ්ඩායමකට යම් දෙයක් අවශ්‍ය බව පැවසීමේදී を නිපාතය සමග ほしがります යොදනු ලැබේ.

- 子供 は あまい もの を ほしがります。

ළමුන්ට පැණිරස දේවල් අවශ්‍ය වේ.

- りょうしん は お金 を ほしがります。

  දෙමව්පියන්ට මුදල් අවශ්‍ය වේ.

## ~V たい です

තමාට යම් කිසි ක්‍රියාවක් කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍ය රටාව භාවිතා කරයි. මෙහිදී ක්‍රියා පදයේ ます ස්වරූපයේ ます ඉවත් කර たいです යොදනු ලැබේ.

かきま~~す~~ +たい です＝かきたい です

よみま~~す~~+たい です＝よみたい です

なりま~~す~~+たい です＝なりたい です

たべま~~す~~+たい です＝たべたい です

しま~~す~~+たい です＝したい です

- わたし は せんせい に **なりたい です**。

  මට ගුරුවරියක් වීමට අවශ්‍යයි.

- わたし は カメラ が **かいたい です**。

  මට කැමරාවක් මිලදී ගැනීමට අවශ්‍ය වේ.

## ~ を たがって います

වෙනත් අයෙකුට යම් කිසි ක්‍රියාවක් කිරීමට අවශ්‍ය බව පැවසීමේදී අදාළ ක්‍රියාපදයේ ます ස්වරූපයේ ます ඉවත් කර を නිපාතය සමග たがって います යොදනු ලැබේ.

- お父さん は 日本 へ **いきたがって います。**

  තාත්තාට ජපානයට යාමට අවශ්‍ය වේ.

- 友だち は 日本語 を **ならいたがって います。**

  යහළුවාට ජපන් භාෂාව ඉගෙන ගැනීමට අවශ්‍ය වේ.

## ~ を たがります

පොදු පුද්ගල කණ්ඩායමකට යම් කිසි ක්‍රියාවක් කිරීමට අවශ්‍ය බව ප්‍රකාශ කිරීමේදී අදාළ ක්‍රියා පදයේ ます ස්වරූපයේ ます ඉවත් කර を නිපාතය සමග たがります යොදනු ලබේ.

- 子供 は あまい もの を **たべたがります。**

  ළමුන්ට පැණිරස දේ කෑමට අවශ්‍යයි.

- 学生 は しけん を **ごうかく したがります。**

සිසුන්ට විභාගයෙන් සමත් වීමට අවශ්‍යයි.

- **4- 3 පාඩමේ** Pratice A , B, C , D **කරන්න.**

## UNIT 4 – 4 [ いくらですか]

言葉 - WORDS

いくら - මිල කීයද

チーズケーキ - චීස් කේක්

チョコレートケーキ - චොක්ලට් කේක්

パイナップル - අන්නාසි

ルピー - රුපියල්

買い物 - බඩු මිලදී ගැනීම

円 - යෙන්

せん - 1000

ぜんぶ - සියල්ලම

まん – 10000

## N +じょすうし で ~です

- A：これはいくらですか。

  මේවා මිල කීයද?

  B : 二つで１００ルピーです。

  දෙකක් රු.100කි.

- このラジオは３だいで５０００ルピーです。

  මෙම රේඩියෝ 3ක් රු.5000ක් වේ.

- このケーキを三つで１０００えんです。

  මෙම කේක් 3ක් යෙන් 1000ක් වේ.

- **4 – 4 පාඩමේ Practice A, B කරන්න.**

## UNIT 1 - 漢字　何才ですか

- කන්ජි පෙළපොතේ 1 වන පාඩම අධ්‍යයනය කරමින් පහත කන්ජි අක්ෂර හදුනා ගන්න.එහි අර්ථය සහ කියවන ආකාරය ලියා දක්වන්න.












